# දැන්වීමයි

## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ආපනශාලා (Canteen) හා කිරිහල් (Milk Bar) ටෙන්ඩර්පත් කැඳවීම - 2022

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන පහත සඳහන් ආපනශාලා හා කිරිහල සඳහා 2022.04.19 වනදින සිට 2022.05.04 වනදින දක්වා ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

එම ටෙන්ඩර්පත් මිහින්තලය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ලේ ශිෂ්‍යසේවා අංශයෙන් ලබාගත හැක. ටෙන්ඩර්පත් ලබාගැනීමේදී රු. 6500.00 ටෙන්ඩර් ගාස්තු (ආපසු ගෙවනු ලබන රු. 3000.00 සහ ආපසු නොගෙවනු ලබන රු. 3500.00) අයකරනු ලැබේ.

ආපනශාලා සඳහා උදේ, දිවා හා රාත්‍රි ආහාර සැපයිය යුතුවන අතර ආහාර සැපයීමේ පළපුරුද්ද අවම වශයෙන් අවුරුදු 03 ක් විය යුතුය. (පළපුරුද්ද පිලිබඳ සහතික ඉදිරිපත් කිරිම අනිවාර්ය වේ.)

- ව්‍යවහාරිකවිද්‍යා පීඨ ආපනශාලාව - මිහින්තලය පරිශ්‍රය
- ප්‍රධාන ආපනශාලාව - මිහින්තලය පරිශ්‍රය
- කළමනාකරණ ආපනශාලාව - මිහින්තලය පරිශ්‍රය
- තාක්ෂණ පීඨ කිරිහල - මිහින්තලය පරිශ්‍රය

එසේම ඉහත සඳහන් කරන ලද ආපනශාලා සඳහා විශ්වවිද්‍යාලය විසින් 75Kg ක ප්‍රමාණයක ගෑස් වටිනාකමට අදාල මුදල, එක් සේවකයෙකුට රු. 10000 ක් වන පරිදි සේවකයින් 03 හෝ 04 දෙනෙක් සඳහා (සිසුන් ප්‍රමාණය මත) සේවක වැටුප්, ආපනශාලාව සඳහා විදුලිය, ජලය හා සේවකයින් වෙනුවෙන් නවාතැන් පහසුකම් නොමිලයේ සපයනු ලැබේ. (කිරිහල් සඳහා ගෑස්බිල්, සේවක වැටුප් හා නවාතැන් පහසුකම් නොලැබෙන අතර විදුලිය හා ජල පහසුකම් සපයනු ලැබේ).

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු 025-2266577 යන දුරකථන අංකයෙන් ලබාගත හැක.

සහකාර ලේඛකාධිකාරි
ශිෂ්‍යසේවා අංශය